


දර්ශන මෙදිස්

## දකුනු ආසියානු ක්‍රිකට්

බ්‍රිතාන්‍ය අධිරාජ්‍යවාදීන් විසින් සිය යටත් විජිතයන් හට ක්‍රිකට් හඳුන්වා දෙන ලද්දේ ශතවර්ශයකටත් පූර්වයෙන් වුව දකුනු ආසියාව පුරා වසංගතයක් මෙන් .ක්‍රිකට් උන. පැතිර ගියේ ඉතා මෑතක දී ය. වඩා නිශ්චිතව කියතොත්, 1983 දී ඉන්දියානු කන්ඩායම ලෝක ශූරතාව හිමි

# කව්බෝයි ක්‍රිකට් - 2

## සංස්කෘතික පරිහානියේ කැඩපත

කර ගත් පසුව ය. අනතුරුව, 1992 දී පාකිස්තානු පිල ද 1996 දී ශ්‍රී ලංකා පිල ද ලෝක ශූරයින් ලෙස අභිශේක ලැබීමත් සමග ඉන්දු උප* මහාද්වීපයෙහි ක්‍රිකට් උන්මාදය පෙර නොවූ විරූ මට්ටමට උත්සන්න වූ අතර මෙකල එය දොරක් දොරක් පාසා රැව් දෙන මාතෘකාවක්ව තිබේ. වෙසක් පුරපසලොස්වක දිනයෙහි ජනතාව ආගමික වත්පිලිවෙත්හි නිරත කරවනු වස් එදින රූපවාහිනියෙන් ක්‍රිකට් නොපෙන්වීමට පියවර ගන්නැයි මෙරට බෞද්ධ භික්ශූහු වරෙක රජයෙන් ඉල්ලා සිටියහ (අභිනව ක්‍රිකට් රැල්ලෙහි තරම පමනක් නොව චිරාගත ආගම මුහුන දී සිටින අර්බුදයෙහි පරිමාව ද ඉන් පෙන්නුම් කෙරේ).



විජිත රාජ්‍යයන්හි ක්‍රිකට් ක්‍රීඩාව මුල දී බ්‍රිතානත් ජාතිකයන් හා ඉංග්‍රීසි උගත් ස්වදේශීය ප්‍රභූ පෙලැන්තිය අත පැවතීමත් වත්මන් ක්‍රිකට් පිපාසාව එක්තරා දුරකට සිසිල් බීම නිශ්පාදකයන් ප්‍රමුඛ බහු ජාතික සංගත කීපයක හා මාධ්‍ය ආයතනයන්හි අනුග්‍රහයෙන් නිර්මිත දේශපාලන උපායක් වීමත් කරනකොටගෙන මේ කලාපයෙහි බොහෝ දෙනා තුල ක්‍රිකට් අරබයා පවතිනුයේ හදිසියේ වගා කෙරුනු, කෘතක රුචිකත්වයකි. පන්දු පිටියෙහි භාවිත වන පරිභාශාවේදයවත් ඔවුහු හරිහැටි නො දනිති.

## ජයසූරිය භූමිකාව

එක් දින ක්‍රිකට්හි, මුල දී ඕවරයකට 3.0ක් පමන වූ ලකුනු රැස් කිරීමෙහි දල වේගය නොබෝ කලෙකින් 5.0 දක්වා වැඩි විය. 1990 ගනන්වල, ශ්‍රී ලංකා පිලෙහි ආරම්භක පිතිකරුවෝ මෙයට නව මානයක් දෙමින් ක්‍රීඩාව උඩුයටිකුරු කලහ එනම්, පන්දු රැකීම සීමා කෙරුනු මුල් ඕවර 15 තුල විශාල ලකුනු ප්‍රමානයක් හඹා ගියහ. ඔවුන් තම පිති ප්‍රහාරය දියත් කලේ ඕවරයකට 08*10 නැතහොත් ඊටත් වැඩි වේගයකිනි. යම්කිසිවෙකු පැවසූ පරිදි, එය ගිනිකෙලි සංදර්ශනයක් විය. ශ්‍රී ලංකා පිලට 1996 ලෝක ශූරතාව හිමි වූයේ ද මූලිකව ම මෙකී උපායෙහි .සාර්ථකත්වය. හේතුවෙනි. මෙහි ප්‍රධාන භූමිකාව (master blaster) රග පෑ සනත් ජයසූරිය තරගාවලියෙහි අනගිතම ක්‍රීඩකයා ලෙස නම් කෙරින. එක් දින ක්‍රිකට්හි වේගවත් ම ශතකය, අර්ධ ශතකය, වැඩි ම හයේ පහරවල් සංඛ්‍යාව, ඕවරයක් තුල රැස් කල වැඩි ම ලකුනු ගනන යන ලෝක වාර්තා ඔහුගේ ගිනුමට බැර විය. .ක්‍රිකට් ක්‍රීඩාවේ බයිබලය. ලෙස සැලකෙන Wisden Cricketers' Alamanack වාර්ශිකය තම චිරාගත සම්ප්‍රදායට පවා පිටුපාමින් එතෙක් එංගලන්ත භූමියෙහි ක්‍රීඩා නොකල ජයසූරිය වසරෙහි හොඳ ම ක්‍රීඩකයන් පස් දෙනා අතරට තෝරා ගති.

ජයසූරිය වීරයෙකු වූයේ පන්දු පිටියෙහි පමනක් නොවේ. ඔහු වෙලෙඳපොලේ ද වීරයෙක් බවට පත් විය. ඉන්දියාවෙහි පෙප්සි සමාගම ඔහු සම PUSHPA PUSHPANANDA EKANAYAKA ප්‍රචාරක ගිවිසුමකට එලඹුනේ ක්‍රීඩකයෙකු සඳහා තමන් ඒ තාක් නොගෙවන ලද මුදලක් ඔහුට පිරිනමමිනි. ලබ්ඵෑල (ලංකා මන්ත්ලි ඩයිජස්ට්) නමැති මෙරට ප්‍රමුඛතම වානිජ ස PUSHPA PUSHPANANDA EKANAYAKA රාව .වසරේ ශ්‍රී ලාංකිකයා. ලෙස ඔහුට උපහාර දැක්වී ය. වෙලෙඳ ප්‍රචාරයට සම්මාදම් වූ ප්‍රථම ක්‍රිකට් ක්‍රීඩකයා ජයසූරිය නොවෙතත් මෙහි සුවිශේශත්වයක් ඇත. ඔහුගේ ප්‍රහාරාත්මක පිති හරඹය ක්‍රිකට් ක්‍රීඩාවෙහි වර්ධනයකට වඩා වානිජ ලෝකය ලද ජයග්‍රහනයක් හැටියට ව්‍යාපාරිකයෝ ගනන් බැලූහ.

ශ්‍රී ලංකා පිලෙහි .සාර්ථකත්වය. දුටු සෙසු රටවල් ද ජයසූරිය අච්චුවේ ප්‍රහාරකයන් සෙවීමෙහි උත්සුක විය. ප්‍රතිඵලය ඉතා ප්‍රකට යද පන්දුවට පහර දීමෙහි කලාත්මක තාක්ශනය .වල් අඩි. හා .පොල් අඩි. මගින් විස්ථාපනය කෙරින. එක් දින තරගයට අවතීර්න වන ටෙස්ට් පිතිකරුවන්ට පවා එලෙස ලකුනු ලබා ගැනුමට බල කෙරී ඇත. ධනපති මාධ්‍ය ආයතන මත යැපෙන, කලෙක ක්‍රිකට් ක්‍රීඩාව බැබලවූ රිචී බෙනෝ, ඉයන් චැපල්, සුනිල් ගවස්කාර් බඳු ප්‍රවීනයන් පවා ඉන් වශීකෘතව කෑ මොර දෙන අතර ඊට හුරේ දමන, විටෙක ප්‍රචන්ඩකාරීව හැසිරෙන අති විශාල ප්‍රේක්ශක ජනකායක් ද නිර්මානය කෙරී ඇත. මේ වනාහි ජරපත් ධනේශ්වර සමාජයේ සංස්කෘතික බාදනයෙහි පැහැදිලි පිලිඹිබුවකි.

## ජාතික විඥානය

අනෙක් අතට, ක්‍රිකට් ක්‍රීඩාවෙහි මෙකී පරිහානිය හුදෙක් වානිජකරනයෙහි විපාකයක් හැටියට සැලකීම වැරදි ය. පන්ති සමාජයෙහි නිර්මිතයක් වූත් ක්‍රීඩා බලධාරීන්, විස්තර කථකයින්, මාධ්‍යවේදීන්, අනුග්‍රාහකයින් හා දේශපාලනඥයින් විසින් නිරන්තරයෙන් උද්දීපනය කෙරෙන්නා වූත් ඉතා ම විසකුරු, ජුගුප්සාජනක මනෝභාවයක් වන ජාතික විඥානය ද ඊට බෙහෙවින් වග කිව යුතු ය. වඩාත් සිත් ගන්නාසුලු කාරනාව නම්, කලෙක පරගැති ක්‍රීඩාවකැයි ක්‍රිකට් අවඥාවෙන් බැහැර කල උදවිය * ඇතැම් ජනතාවාදීන් හා ජාතික චින්තනවාදීන් පවා එලිපිට නොවේ නම් රහසිගතව එය වැලැඳ ගැනීම යි.

ශ්‍රී ලංකාවට ටෙස්ට් වරම හිමි වීමට පෙර, මෙරට ක්‍රිකට් පිටියෙහි පැවති (ලියුම්කරු සියැසින් දුටු) එක්තරා යථාර්ථයක් ඇතද එවක සිටි ප්‍රේක්ශක ප්‍රභූවරුන් තම පිලට මෙන් ම ආරාධිත විදේශීය පිලට ද සමෝසමව අත්පොලසන් දුන්හ. ප්‍රේක්ශාගාර තුල ජාතික ධජ ලෙල දුන්නා නම් ඒ ඉතා කලාතුරෙකිනි. හූ හරෑක සේයාවකුදු නොවී ය. එහෙත්, මෙතතු වෙනස් වීමට ගත වූයේ එක් රැයකිරූ ජාතන්නුරාගයෙන් මත් කරන ලද අලූත්, ආගන්තුක, ලුම්පිත ප්‍රජාවක් පිටිය ආක්‍රමනය කිරීමත් සමගිනි.

ප්‍රකට සමාජ විද්‍යාඥයන් දෙදෙනෙකු වන ඩේවිඩ් ඩන්හැම් හා සිසිර ජයසූරිය පෙන්වා දෙන පරිදි, ලවාර්ගික ගැටුම, භීශනය, අසමානතාව, පරිපීඩනය, දරිද්‍රතාව, අයථා දේශපාලනය යනාදියෙන් හෙම්බත්ව සිටි මෙරට ජනතාව ක්‍රිකට් ක්‍රීඩාව වෙත ඇදී ගියේ රටක් වසයෙන් ශ්‍රී ලංකාව දිනුමක් ලද එක ම ක්ශේත්‍රය එය වූ බැවිනි. පුරා දශකයක් ප්‍රචන්ඩතාව අත්දුටු සහ ධර්මිශ්ඨ සමාජයක් පිලිබඳ පූර්ව සිහින වාශ්පීභවනය වනු දුටු රාජ්‍යයකට ක්‍රිකට්වලින් ලැබුනේ මහු අස්වැසිල්ලකි. එමගින් මහජනතාවන් හට පලා යෑමෙහි මගක් විවෘත වියල (,He who pays the pipero Mephistopheles and the opiate of one)day cricket˜, Pravada, 1999, කලාපය 6,1). මෙරටෙහි ක්‍රිකට් ජනප්‍රිය වීමෙහිලා ඉවහල් වූ එබඳු සුවිශේශ සාධක පැවතියේ වුව, ක්‍රිකට් සමග කැලතුනු ජාතිකවාදය (nationalism) කිසිසේත් තනි රටකට සීමා වූවක් නොවේ. සියලූ ක්‍රීඩාවන් විශයෙහි පොදුවේ අවුලූවනු ලබන ජාත්‍යෝන්මාදය වැඩී එනුයේ එක ම මූලයකිනිද පරිහානිගත ධනේශ්වර ක්‍රමයෙනි. එහෙයින්, මෙය හුදු ශ්‍රී ලාංකික ප්‍රපංචයක් වසයෙන් සලකා ගැනුමෙහි දී, පූර්වෝක්ත ලේඛක දෙපල පාඨකයාගෙන් වසන් කරනුයේ එම අති මූලික කරුන යි.

නිශ්පාදනයෙහි භූගෝලීයකරනයත් සමග .ජාතික රාජ්‍යය. නමැති යල් පීනු සංකල්පයෙහි පල්ල ගැලවී ගිය ද සංස්කෘතික ක්ශේත්‍රයෙහි තවමත් ජාතිකාභිමානය ඔජ වඩවනු ලැබේ. මහජනතාවන් තුල ව්‍යාජ දෘශ්ටිවාදයක් රෝපනය කරමින් ද, ජාතීන් භේදභින්න කරමින් ද (ඉන්දියාව හා පාක-ිස්ථානය අතර ක්‍රිකට් තරගයක් යනු කුඩා යුද්ධයකි) ලෝක පරිමානව ධනපති පන්ති පාලනය තවදුරටත් පවත්වාගෙන යෑම මෙහි අරමුන යි. තරගකාරී ක්‍රීඩාව ජාතිකවාදයට සරු පසකි. ක්‍රීඩා ලෝලීන් ජාතික කොඩි. වනමින් ද ජාතික ගී ගයමින් ද ඔල්වරසන් නගන අතරෙහි ව්‍යාපාරිකයෝ තම ලාභ රේට්ටු ඉහල නංවා ගනිති පාලකයෝ මර්දනය දැඩි කරති.

ජාතික විඥානය ඒ ඒ භූමියෙහි දී විවිධ ස්වරූප ගනී. ක්‍රිකට් ක්‍රීඩාවෙහි පොල්මෑකාර එංගලන්තයෙහි දී එය ඉංග්‍රීසි (ඇන්ග්ලෝ සැක්සන්) සංස්කෘතික ජාතිකවාදය වෙයි. ඉන්දියාවෙහි දී එය හින්දු ස්වෙ-ෘත්තමවාදය සමග ද, පාකිස්ථානයෙහි දී එය එක්තරා දුරකට ඉස්ලාම් මූලධර්මවාදය සමග ද බැඳී පවතී. දකුනු අප්‍රිකාවෙහි (මෑතක් වන තෙක්) එය නිල වර්නභේදවාදය විය. ඇබොරිජිනු ස්වදේශිකයන් හට ක්‍රිකට් වරම අහිමි කැන්ගරු දේශයෙහි දී එය සුදු ඕස්ට්‍රේලියාවක් පිලිබඳ ස්ව-ප්නයකි. ජාතික කන්ඩායම්වලට ඉඳහිට වෙනස් ජනවර්ගයන්ට අයත් ක්‍රීඩකයන් ඇතුලත් වීම නොතකා එය එසේ වෙයි.

**(ලිපියෙහි අක්ෂර වින්‍යාසය ලේඛකයාට අභිමත පරිදි යොදා ඇත.)**

ළබන කළාපයට

A.T. PARTNERS
Accountants & Business Advisors Pty Ltd

**Online Tax Returns from $49***

1. Complete your tax information secuerly online by visiting **www.atpartners.com.au**
2. Your tax details will be reviewed & validated by a Registered Tax Agent
3. We will advise you on any additional tax detuctions that you can claim
4. We will act as your Registered Tax Agent regarding all ATO inquiries
5. Electronic lodgement & refund in less than 14 days

**Alternatively.......you can come to us ,**

***Get your Personal Tax Return done from $77****

Evening & Weekend appointments are available. * Conditions apply

**Other services we offer....**

- ✓ Tax Returns for Partnerships, Companies, SMSF's & Trusts
- ✓ Rental Property & Negative Gearing
- ✓ Tax Planning & Business Advise
- ✓ Administration & compliance of Self Managed Superannuation Funds
- ✓ New Business Registration & Company/Family Trust setups
- ✓ BAS, IAS, PAYG preparation & lodgement
- ✓ ASIC & ATO Liaison, Payment Plans & Amendments

*Please contact us to arrange your initial FREE consultation.*

*Achini : 0468 747 574* *email: info@atpartners.com.au*
*Tharanga : 0402 980 959* *web: www.atpartners.com.au*
*Office : 03 8768 8630*

AT Partners Accountants & Business Advisors Pty Ltd **ACN 150 795 716**
23 Tobin Way Lyndhurst VIC 3975